0664

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

29 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடல் ஊடகக்கற்கை I
Communication and Media Studies I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**සැලකිය යුතුයි :**
- ✼ **සියලු ම** ප්‍රශ්නවලට උත්තර සපයන්න.
- ✼ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✼ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිලිමත් ව කියවන්න.
- ✼ **1** සිට **50** තෙක් වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන උත්තරවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** උත්තරය තෝරා ගෙන එය **උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

1. මහේෂ් හා සුරේෂ් සමීප මිතුරන් දෙදෙනෙකි. එහෙත් එකිනෙකා රැවටීමට දෙදෙනා ම යම් යම් උපක්‍රම පිළිබඳව කල්පනා කළහ. එබඳු අවස්ථාවක දක්නට ලැබෙන්නේ
   (1) අන්තර් පුද්ගල සන්නිවේදනයයි. (2) සමූහ සන්නිවේදනයයි.
   (3) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයයි. (4) නිර්වාචික සන්නිවේදනයයි.
   (5) අවිධිමත් සන්නිවේදනයයි.

2. "සන්නිවේදන ක්‍රියාවලිය එක් ස්ථානයකින් ආරම්භ වී තවත් ස්ථානයකින් කෙළවර වන්නේ යැයි සිතීම සාවද්‍ය ය." මෙම ප්‍රකාශය වඩාත් හොඳින් ප්‍රකට වන සන්නිවේදන ආකෘතිය වන්නේ
   (1) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය. (2) ෂැනොන් හා වීවර් ය.
   (3) විල්බර් ශ්‍රාම් ය. (4) ඩේවිඩ් කේ. බර්ලෝ ය.
   (5) ඇරිස්ටෝටල් ය.

3. වේදිකා නාට්‍යයක දී වඩාත් දකගත හැක්කේ
   (1) විධිමත්, වාචික, ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනයයි.
   (2) වාචික, අවාචික, ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනයයි.
   (3) ශ්‍රව්‍ය, වාචික, අවිධිමත් හා දෘශ්‍ය සන්නිවේදනයයි.
   (4) වාචික, අවාචික, අවිධිමත් හා ලිඛිත සන්නිවේදනයයි.
   (5) දෘශ්‍ය, ලිඛිත, විධිමත් හා අවිධිමත් සන්නිවේදනයයි.

4. පුද්ගලයකුගේ සිත තුළ හටගන්නා අදහස්, සිතුවිලි ආදිය සංකේත ඇසුරෙන් ප්‍රේෂණීය බවට පරිවර්තනය කිරීම
   (1) ආකේතිකරණයයි. (2) විකේතිකරණයයි.
   (3) ආත්මභාෂණයයි. (4) කේතකරණයයි.
   (5) ස්වයං සංකල්පයයි.

5. සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර ඇති සමානත්වය පිළිබඳ වඩාත් හොඳින් විස්තර වන්නේ
   (1) විල්බර් ශ්‍රාම් ආකෘතියේ දී ය. (2) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතියේ දී ය.
   (3) ෂැනොන් හා වීවර් ආකෘතියේ දී ය. (4) ශ්‍රාම් - ඔස්ගුඩ් ආකෘතියේ දී ය.
   (5) ඩේවිඩ් කේ. බර්ලෝ ආකෘතියේ දී ය.

6. විද්‍යුත් සන්නිවේදන ක්‍රියාවලියක දී බාධකයක් **නොවන්නේ**
   (1) ගුවන්යානයක් ඉහළින් පියාසර කිරීමයි. (2) පරිසරයේ අධික උෂ්ණත්වය හා ආර්ද්‍රතාවයි.
   (3) ග්‍රාහකයාගේ අසනීප තත්ත්වයයි. (4) මාධ්‍යමය දැනුම නොමැති වීමයි.
   (5) ආවරණ කලාපය තුළ සිටීමයි.

7. අන්තර් පුද්ගල සන්නිවේදනය යනු දෛනික ජීවිතයේ අත්‍යවශ්‍ය සන්නිවේදන අවස්ථාවකි. කණ්ඩායම් සන්නිවේදනයට සාපේක්ෂව එහි කැපී පෙනෙන ලක්ෂණය වන්නේ
   (1) සන්නිවේදකයා භාෂාව යොදා ගැනීමයි. (2) ග්‍රාහකයා හොඳින් ශ්‍රවණය කිරීමයි.
   (3) සන්නිවේදක හා ග්‍රාහක භූමිකා ස්ථාවර වීමයි. (4) නිර්වාචික සන්නිවේදනය ප්‍රබල වීමයි.
   (5) එක් පුද්ගලයකු පමණක් සිටීමයි.

[ දෙවැනි පිටුව බලන්න.

8. ජනමාධ්‍යයේ ස්වභාවය අනුව ඇතැම් අවස්ථාවල දී භාෂාවේ ලුහුඬු ව්‍යවහාර යොදා ගැනීමට සිදුවේ. මේ තත්ත්වය වඩාත් දැකගත හැකි වන්නේ
(1) පුවත්පත් මාධ්‍යයේ දී ය.
(2) ගුවන්විදුලි මාධ්‍යයේ දී ය.
(3) රූපවාහිනී මාධ්‍යයේ දී ය.
(4) සිනමා මාධ්‍යයේ දී ය.
(5) නව මාධ්‍යයේ දී ය.

9. 'කපුටා සහ කේජු කැල්ල' පිළිබඳ කතා පුවත පන්ති කාමරයේ දී ඉදිරිපත් කළ ගුරුවරයා එහි වඩාත් සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නගන ලෙස සිසුන්ට කීවේ ය. ගුරුවරයා මෙහි දී අපේක්ෂා කරන ලද්දේ සිසුන් තුළ ඇති
(1) චිත්‍ර කලාව පිළිබඳ ප්‍රවීණත්වය මැන ගැනීමයි.
(2) නිර්මාණාත්මක සන්නිවේදන කුසලතා හඳුනා ගැනීමයි.
(3) යමක් නිශ්චිත ලෙස හඳුනා ගැනීමේ හැකියාව දැන ගැනීමයි.
(4) කලාව පිළිබඳ පවතින අවබෝධය නිරීක්ෂණය කිරීමයි.
(5) ජනකතා පිළිබඳ අවබෝධය හඳුනා ගැනීමයි.

10. විවිධ සන්නිවේදන අවස්ථාවල ප්‍රතිපෝෂණය සිදුවේ. එවැනි අවස්ථාවලට සාපේක්ෂව ජනසන්නිවේදනයේ දී ප්‍රතිපෝෂණය සිදුවන්නේ
(1) බහුල හා ක්ෂණික ස්වරූපයෙනි.
(2) සීමිත හා පමා වන ස්වරූපයෙනි.
(3) සීමිත හා ක්ෂණික ස්වරූපයෙනි.
(4) අතිශය සීමිත හා සාමාන්‍යයෙන් පමා වූ ස්වරූපයෙනි.
(5) අතිශය බහුල හා සාමාන්‍යයෙන් ක්ෂණික ස්වරූපයෙනි.

11. පුවත්පතක උප කර්තෘවරයකුට ලැබුණු ලිපියක පහත සඳහන් වැකි ඇතුළත්ව තිබිණි. ඒ අතුරෙන් සංශෝධනය කිරීමට සිදු **නොවන්නේ** කුමන වාක්‍යය ද?
(1) සියල්ලෝ ළඟ ළඟ එන විපත් ගැන සිතමින් වික්ෂිප්තව සිටියේ ය.
(2) සමහරු පලතුරු වර්ග බැරල්වල දමාගෙන ඒ මතට යීස්ට් ඉස පැසවන්නට උත්සාහ ගනිමින් සිටියහ.
(3) උපන්දින කේක් එක කපා ඒ කණ්ඩායමේ හැම කෙනෙකුට ම කැවූහ.
(4) ඔහු මේ ව්‍යසනය හැබැහින් ම දක අවබෝධ කරගන්නට සිතට ගන්නා ලදී.
(5) හදිසි අනතුරකින් පුද්ගලයන් තිදෙනෙක් මරණයට පත් විය.

12. 'උපභාෂාවක්' පිළිබඳ ව හඳුන්වා දීමේ දී එයට අදාළ **නොවන** කරුණ තෝරන්න.
(1) ප්‍රධාන භාෂා ධාරාවේ අනුධාරාවක් වීම
(2) උපසංස්කෘතික ලක්ෂණවලින් යුක්ත වීම
(3) ප්‍රාදේශීය භාෂා ලක්ෂණවලින් යුක්ත වීම
(4) උපකාරක භාෂා ලක්ෂණවලින් යුක්ත වීම
(5) සීමිත කණ්ඩායම් අතර භාවිත වීම

13. මානව ජීවිතය සන්නිවේදන ක්‍රියාවලියට අනුගත වීම ආවේණික ලක්ෂණයක් වන්නේ
(1) පෙරදිග සංස්කෘතියේ ය.
(2) අපරදිග සංස්කෘතියේ ය.
(3) පුරාතන සංස්කෘතියේ ය.
(4) ගෝලීය සංස්කෘතියේ ය.
(5) මධ්‍යතන යුරෝපීය සංස්කෘතියේ ය.

14. "සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘතියක දී තොරතුරු/දත්ත රැස් කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රමවේද මොනවා දැයි" ගුරුතුමා ඇසූ ප්‍රශ්නයට ලැබුණු පිළිතුරු කිහිපයක් පහත සඳහන් වේ.
A - සම්මුඛ සාකච්ඡා
B - සමීක්ෂණය
C - නිරීක්ෂණය
D - නියැදිකරණය
E - නාමකරණය
මේවා අතුරෙන්
(1) A,B,C සත්‍ය වන අතර D,E අසත්‍ය වේ.
(2) A,B සත්‍ය වන අතර C,D,E අසත්‍ය වේ.
(3) B,C,D සත්‍ය වන අතර A,E අසත්‍ය වේ.
(4) C,E සත්‍ය වන අතර A,B,D අසත්‍ය වේ.
(5) A,B,C,D හා E යන සියල්ල ම සත්‍ය වේ.

15. ඊයේ සිදු වූ බරපතල රිය අනතුරක් පිළිබඳ සියලු වැදගත් තොරතුරු අද පුවත්පත්වල වාර්තා වී තිබේ. මෙය
(1) කාලීන පුවත් වාර්තාකරණයකි.
(2) ගවේෂණාත්මක පුවත් වාර්තාකරණයකි.
(3) ප්‍රාදේශීය පුවත් වාර්තාකරණයකි.
(4) මෘදු පුවත් වාර්තාකරණයකි.
(5) දෘඪ පුවත් වාර්තාකරණයකි.

16. ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියකට අදාළ සංදේශ සකස් කිරීමේ දී ජනශ්‍රැතියට ප්‍රමුඛතාව දිය යුතු යැයි සන්නිවේදන විශේෂඥයින් පෙන්වා දී ඇත. එවැනි නිගමනයකට එළඹීමට හැකි වන්නේ
(1) ජනශ්‍රැතියේ කෘති අයිතිය පිළිබඳ ගැටලුවක් නොපවතින බැවිනි.
(2) ජනශ්‍රැතිය ජන විඥානයට සමීප බැවිනි.
(3) ජනශ්‍රැතිය යනු ග්‍රාමීය මූලයක් සහිත නිර්මාණයක් වන බැවිනි.
(4) ජනශ්‍රැතිය හා සංවර්ධනය අතර සම්බන්ධතාවක් ඇති බැවිනි.
(5) ජනශ්‍රැතිය නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රමෝපායක් බැවිනි.

[ තුන්වැනි පිටුව බලන්න.

0664



17. "මම ඔබගේ මතයට ඉඳුරා ම විරුද්ධ වෙමි. එහෙත් ඔබට එම මතය දැරීමට ඇති අයිතිය වෙනුවෙන් මම දිවි හිමියෙන් පෙනී සිටිමි." මෙම ප්‍රකාශයෙන් ගම්‍ය වනුයේ
 (1) සාමූහිකත්වයේ අවශ්‍යතාවයි.
 (2) සහෝදරත්වයේ වටිනාකමයි.
 (3) විසම්මුතියේ වැදගත්කමයි.
 (4) සහවේදනයේ ස්වභාවයයි.
 (5) සාධාරණත්වයේ අයිතියයි.

18. ආධ්‍යාත්මික සංස්කෘතියට ඇතුළත් **නොවන්නේ**
 (1) ආගමයි.
 (2) පුරාණෝක්ති වේදයයි.
 (3) දේශපාලනයයි.
 (4) කලාවයි.
 (5) දර්ශනයයි.

19. ජනසන්නිවේදන ක්‍රියාවලිය තුළ බොහෝ දොරටුපාලකයන් සිටින බව කියනු ලැබේ. ඔබ එවැනි දොරටුපාලකයකු නම්, ඔබගේ කාර්යයෙහි අවසාන ප්‍රතිඵලය වන්නේ
 (1) ජනමාධ්‍ය අතර තරගය පාලනය කිරීමයි.
 (2) ජනමාධ්‍ය තුළ සමතුලිත බව පාලනය කිරීමයි.
 (3) ජනමාධ්‍ය තුළින් පණිවිඩ ගලා යාම පාලනය කිරීමයි.
 (4) ජනමාධ්‍ය අන්තර්ගතයෙහි නිරවද්‍යතාව පාලනය කිරීමයි.
 (5) ජනමාධ්‍ය මගින් ඇතිවිය හැකි අහිතකර බලපෑම පාලනය කිරීමයි.

20. සන්නිවේදනය පිළිබඳ වඩා නිවැරදි අර්ථකථනය කුමක් ද?
 (1) තොරතුරු සබඳතාවකි.
 (2) තොරතුරු සම්ප්‍රේෂණය සහ ලබාගැනීමේ ක්‍රියාවලියකි.
 (3) පොදුජන සන්නිවේදන සහ පොදුජන තොරතුරු මාධ්‍යයකි.
 (4) විවිධ ප්‍රතිග්‍රාහක සහ සම්ප්‍රේෂණ උපකරණවල අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයකි.
 (5) ප්‍රායෝගික අන්තර් ක්‍රියාවලියකි.

21. තොරතුරු සමාජයක ජීවත්වන පුද්ගලයකු නිරන්තරයෙන් ජනමාධ්‍ය හරහා ප්‍රකාශයට පත්වන විවිධාකාර වූ පණිවිඩ රාශියකට නිරාවරණය වේ. එකී පණිවිඩ නිසියාකාරව අවබෝධ කර ගැනීමට හා අර්ථකථනය කිරීමට ඇති හැකියාව
 (1) මාධ්‍ය ඒකාකෘතිකරණයයි.
 (2) මාධ්‍ය විශ්ලේෂණයයි.
 (3) මාධ්‍ය සාක්ෂරතාවයි.
 (4) මාධ්‍ය විචාරයයි.
 (5) මාධ්‍ය සංජානනයයි.

22. ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ විග්‍රහයේ දී අවධානයට වඩාත් හසු **නොවන්නේ**
 (1) සංස්කෘතික නිෂ්පාදන ක්ෂේත්‍රයයි.
 (2) ප්‍රමාණාත්මක ක්ෂේත්‍රයයි.
 (3) හෙජමොනිය සංකල්ප ක්ෂේත්‍රයයි.
 (4) බහු ජන සංස්කෘතික ක්ෂේත්‍රයයි.
 (5) සෞන්දර්යය විද්‍යාත්මක ක්ෂේත්‍රයයි.

23. හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය
 A - චක්‍රීය ගලා යාමක් සහිත වූවකි.
 B - 'බලපෑම' පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන්නකි.
 C - 'ග්‍රාහකයා' පිළිබඳ අඩු සැලකිල්ලක් දක්වන්නකි.
 D - සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග හතරක් මත පදනම් වූවකි.

 ඉහත ප්‍රකාශ අතුරෙන්
 (1) A හා B පමණක් සත්‍ය වේ.
 (2) B හා C පමණක් සත්‍ය වේ.
 (3) C හා D පමණක් සත්‍ය වේ.
 (4) A,B,C හා D යන සියල්ල ම සත්‍ය වේ.
 (5) A,B,C හා D යන සියල්ල ම අසත්‍ය වේ.

24. නව ලිබරල්වාදය විග්‍රහ කිරීමේ දී ඊට **නොගැළපෙන** යෙදුම කුමක් ද?
 (1) මාධ්‍ය සංස්කෘතියේ ප්‍රධාන භූමිකාවක් වීම
 (2) බටහිර යුරෝපීය ව්‍යාපාරික ආධිපත්‍යය මුල් වීම
 (3) ගෝලීයකරණය සමග ගැටීම
 (4) ජාතික ආර්ථික ස්වාධීනත්වය සමග ගැටීම
 (5) ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වීම

25. භාෂා උපාර්ජනය යනු භාෂාවේ
 (1) පවතින අනන්‍ය ලක්ෂණ හඳුනා ගැනීමයි.
 (2) වචනවලට නව අර්ථ ජනනය කරවීමයි.
 (3) ග්‍රහණය හා පරිහරණය ඉගෙනීමයි.
 (4) වචනවල අර්ථය අනුව භාවිතය වෙනස් වීමයි.
 (5) රීති සමුදායන් මනාව හඳුනා ගැනීමයි.

26. නවීකරණ ක්‍රියාවලියේ දී යම් ජන කොට්ඨාසයක සංස්කෘතික වටිනාකම් අවශ්‍යයෙන් ම සැලකිල්ලට ගත යුත්තේ
 (1) කලාත්මක ශෛලීය ක්‍රමයක් ලෙස ය.
 (2) මිනිසුන්ගේ සංස්කෘතික අනුවර්තනයේ ප්‍රකාශනයක් ලෙස ය.
 (3) සාම්ප්‍රදායිකත්වය සංරක්ෂණය කිරීමක් ලෙස ය.
 (4) සමාජ සංස්කෘතික නිර්මාණයේ පදනමක් ලෙස ය.
 (5) මිථ්‍යාවාදී චාරිත්‍රවාරිත්‍ර පද්ධතියක් ලෙස ය.

[ හතරවැනි පිටුව බලන්න.

27. "සංවර්ධනය සඳහා විශ්වයට ම පොදු වූ මාවතක් නැත. සෑම රටක් ම තම රටට උචිත වූ උපාය මාර්ග සොයා ගත යුතු ය." මෙම ප්‍රකාශයට අනුව සංවර්ධනය වෙමින් පවතින රටක් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දී භාවිතයට **නොගත** යුත්තේ කුමක් ද?
(1) නවීකරණය (Modernization)
(2) නාගරීකරණය (Urbanization)
(3) කාර්මීකරණය (Industrialization)
(4) බටහිරකරණය (Westernization)
(5) සහවේදනය (Empathy)

28. "පාසල් ඉගෙනුම් කටයුතු සඳහා පුවත්පත් මාධ්‍ය යොදා ගැනීම." මැයෙන් ක්‍රියාත්මක කළ සන්නිවේදන ව්‍යාපෘතියක වාර්තාව සැකසීම ඔබට බාර වී තිබේ. එම වාර්තාවට ඇතුළත් **නොකළ** යුත්තේ
(1) පර්යේෂණ ක්‍රමවේදය කවරේද යන්න ය.
(2) භාවිත කළ නියැදිකරණ විධි ක්‍රම ය.
(3) නිගමන හා යෝජනා ය.
(4) සංවර්ධන ව්‍යාපෘති වර්ගීකරණය ය.
(5) යොදා ගත් මානව හා භෞතික සම්පත් ය.

29. පහත සඳහන් ප්‍රකාශ නියෝජනය කරන භාෂා ප්‍රභේද නිවැරදි අනුපිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.
A - සන්නිවේදන ක්‍රියාවලියේ දී භාෂාව ශබ්දනගා ප්‍රකාශ කිරීම
B - පෞද්ගලික දෘෂ්ටියක් මෙන් ම මතවාදයක් අවශ්‍ය වීම
C - යෙදුම්, රිද්ම, වේගය ආදියේ සුවිශේෂතා ඇති බව
(1) A- විවරණය B - ලේඛනය C - කථනය
(2) A- භාෂණය B - විවරණය C - කථනය
(3) A- කථනය B - භාෂණය C - රූපණය
(4) A- කථනය B - විවරණය C - රූපණය
(5) A- රූපණය B - භාෂණය C - විවරණය

30. X නමැති සමාගම මගින් ආයතනික සඟරාවක් (In-house journal) ප්‍රකාශයට පත්කිරීමට යෝජනා කෙරිණි. එවැන්නකින් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සාකච්ඡාවක් ඇති විය. එහි දී මතු වූ අදහස්වලින් **නොගැළපෙන** අදහස කුමක් ද?
(1) සමාගමේ ලාභය හා වත්කම් ඉහළ නැංවීමට අනුගමනය කරන ක්‍රමවේද සාධාරණීකරණය කළ හැකි ය.
(2) සේවකයින්ට ආරක්ෂාව, එලදායකත්වය හා සුබසාධනය පිළිබඳ කරුණු දක්විය හැකි ය.
(3) සමාගමේ පරිපාලන මතය සේවකයන් වෙත ගෙන යා හැකි ය.
(4) සමාගමේ නිෂ්පාදන පිළිබඳ ජනතාව දැනුවත් කළ හැකි ය.
(5) සේවකයින්, කොටස්කරුවන්, නියෝජිතයින් හා සුබ පතන්නන් වෙත තොරතුරු බෙදාහැරිය හැකි ය.

31. "ඊයේ සවස කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති වෘත්තිකයන්ගේ සමුළුව අමතු ජනමාධ්‍ය අමාත්‍යවරයා සෑම වෘත්තිකයකු ම සිය වෘත්තීය ගරුත්වය ආරක්ෂා කිරීම පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතු බව ප්‍රකාශ කළේ ය." ඉහත ප්‍රකාශය පුවත්පතක පළ වූ ප්‍රවෘත්තියක
(1) කොටසක් විය හැකි ය.
(2) ශීර්ෂ පාඨය විය හැකි ය.
(3) මූල පාඨය විය හැකි ය.
(4) සමාප්තිය විය හැකි ය.
(5) සංක්ෂිප්තය විය හැකි ය.

32. ජනශ්‍රැති විද්‍යාඥයින්ගේ මතය අනුව ජන කවිය තුළින් සමාජ ආර්ථික සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනය කළ හැකි ය. එය වඩාත් නිරූපණය වන අධ්‍යයන ක්ෂේත්‍රය වන්නේ
(1) දේශපාලන විද්‍යා අධ්‍යයනයයි.
(2) ඉතිහාසය අධ්‍යයනයයි.
(3) මනෝ විද්‍යා අධ්‍යයනයයි.
(4) මානව විද්‍යාත්මක අධ්‍යයනයයි.
(5) ජීව විද්‍යාත්මක අධ්‍යයනයයි.

33. සමාජයීය විද්‍යා ක්ෂේත්‍රයේ බහුලව භාවිත වන යෙදුම් කිහිපයක් පහත දක්වේ.
A - නවීකරණය
B - කාර්මීකරණය
C - සමාජ වෙනස
D - ප්‍රගතිය
E - වර්ධනය
ඒ අතුරෙන් සංවර්ධනය යන යෙදුම හා සම්බන්ධ පර්යාය යෙදුම් කාණ්ඩය වනුයේ
(1) A,B,C හා D ය.
(2) A,B,C හා E ය.
(3) B,C,D හා E ය.
(4) A,B,D හා E ය.
(5) A,B,C,D හා E යන සියල්ල ම ය.

34. රූපවාහිනී මාධ්‍යය සමාජය තුළ වඩාත් ජනප්‍රිය මාධ්‍යය බව වෙළෙඳ පොළ සමීක්ෂණ වාර්තා මගින් හෙළිදරව් වී ඇත. එබඳු ජනප්‍රියත්වයකට වඩාත් බලපාන වැඩසටහන් කාණ්ඩය තෝරන්න.
A - ප්‍රවෘත්ති වැඩසටහන්
B - ටෙලිනාට්‍ය වැඩසටහන්
C - Reality වැඩසටහන්
D - සංගීතමය වැඩසටහන්
E - ආගමික වැඩසටහන්
F - ජ්‍යෝතිෂ වැඩසටහන්
G - ළමා වැඩසටහන්
(1) A,B,C,D (2) A,B,E,F (3) B,C,F,G (4) B,C,D,E (5) C,D,F,G

[ පස්වැනි පිටුව බලන්න.

35. පුරවැසි ජනමාධ්‍ය
(1) සමාජයේ සියලු ම සාමාජිකයින් වෙනුවෙන්, රජය මගින් පාලනය කෙරෙයි.
(2) පුරවැසියන්ගේ සහභාගිත්වය ලබා ගනී.
(3) සමාජ සංවිධානවල හා වෙනත් පුරවැසි කණ්ඩායම්වල එකතුවකි.
(4) සියලු පුරවැසි අවශ්‍යතා වෙනුවෙන් ක්‍රියාත්මක වේ.
(5) අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.

36. රූපවාහිනිය නරඹන සමහර දරුවන්ගේ කතාබහ ඇවතුම් පැවතුම් හා හැසිරීම් රටා තරමක් දුරට එම මාධ්‍යයේ හමුවන විවිධ චරිතවල අනුකරණයන් බව පර්යේෂණයකින් පෙනී ගියේ ය. මෙවැනි තත්ත්වයක් වඩාත් හොඳින් විග්‍රහ වන්නේ
(1) සහානුභූති සංකල්පය ඇසුරිනි.
(2) ඒකාකෘතිකරණ සංකල්පය ඇසුරිනි.
(3) දෙපියවර සංකල්පය ඇසුරිනි.
(4) සමාජ වගකීම් සංකල්පය ඇසුරිනි.
(5) සමාජානුයෝජන සංකල්පය ඇසුරිනි.

37. ශ්‍රවණ ක්‍රියාවලිය යනු ප්‍රගුණ කළ හැකි ශක්‍යතාවකි. මෙහි අනුපිළිවෙළ වන්නේ
(1) ඇසීම, තේරුම් ගැනීම, ඇගයීම හා ප්‍රතික්‍රියා දැක්වීම ය.
(2) තේරුම් ගැනීම, ඇසීම, ඇගයීම හා ප්‍රතික්‍රියා දැක්වීම ය.
(3) ඇසීම, ඇගයීම, තේරුම් ගැනීම හා ප්‍රතික්‍රියා දැක්වීම ය.
(4) තේරුම් ගැනීම, ඇසීම, ප්‍රතික්‍රියා දැක්වීම හා ඇගයීම ය.
(5) ඇසීම, තේරුම් ගැනීම, ප්‍රතික්‍රියා දැක්වීම හා ඇගයීම ය.

38. 'ස්ටාර්' නමැති ගුවන්විදුලි නාලිකාව සතුව විශාල ග්‍රාහක ක්ෂේත්‍රයක් ඇති බව වාර්තා වේ. ජනමාධ්‍ය ග්‍රාහක ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් වඩාත් නිවැරදි අදහස වන්නේ, එය
(1) තෝරාගත් පිරිසක් බවයි.
(2) කල්පිත කණ්ඩායමක් බවයි.
(3) හඳුනාගත් කණ්ඩායමක් බවයි.
(4) විශාල කණ්ඩායමක් බවයි.
(5) පාරිභෝගික පිරිසක් බවයි.

39. පුළුල් ජනතාවක් අරමුණු කර ගෙන වෘත්තිකයින් විසින් නිර්මාණය කරනු ලබන සංස්කෘතිය
(1) බහුජන සංස්කෘතියයි.
(2) ජන සංස්කෘතියයි.
(3) සම්භාව්‍ය සංස්කෘතියයි.
(4) ප්‍රභූ සංස්කෘතියයි.
(5) වාර්ගික සංස්කෘතියයි.

40. මෙරට ජනමාධ්‍ය ඔස්සේ ජනප්‍රිය සංස්කෘතිකාංග සීමාව ඉක්මවා ග්‍රාහකගත කිරීම නව ප්‍රවණතාවක් ලෙස දැකගත හැකි ය. එය
(1) තාරුණ්‍යය ප්‍රබෝධමත් කිරීමකි.
(2) ජනමාධ්‍ය විවිධාංගීකරණයට ලක්කිරීමකි.
(3) ග්‍රාහක අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි.
(4) අන්තර් සංස්කෘතිය පිළිබඳ ව අධ්‍යයනය කිරීමකි.
(5) සංවර්ධන සන්නිවේදන ගැටලුවකි.

41. දේශකයෙක් සිය දේශනයේ දී ඥාන ගවේෂණය යනු කුමක් ද'යි පැහැදිලි කිරීමට ඉදිරිපත් කළ අදහස් කිහිපයක් පහත දක්වෙන අතර ඉන් **සදොස්** අදහස තෝරන්න.
(1) ඥාන ගවේෂණය ඓතිහාසික සිද්ධියකි.
(2) ඥාන ගවේෂණයේ දී විවිධ ශිල්ප ක්‍රම භාවිත කෙරෙයි.
(3) ඥාන ගවේෂණය බල ක්ෂේත්‍රයට අභියෝගයක් වේ.
(4) ඥාන ගවේෂණය න්‍යායික ගවේෂණයේ ප්‍රතිඵලයක් පමණි.
(5) ඥාන ගවේෂණය යනු ලෝකය අනාවරණය කර ගැනීමයි.

42. ලෝකයේ ඕනෑම ස්ථානයක සිදුවන සිද්ධියක් මිනිසාට විස්තරාත්මකව ප්‍රකාශ කිරීමේ හැකියාව ලැබී ඇත්තේ
(1) නිර්මාණාත්මක හා අවිහිතභාවය නිසා ය.
(2) අවිහිතභාවය හා ද්විත්වභාවය නිසා ය.
(3) අවිහිතභාවය හා දුරස්ථාපනය නිසා ය.
(4) විශේෂීකරණය හා ද්විත්වභාවය නිසා ය.
(5) දුරස්ථාපනය හා ද්විත්වභාවය නිසා ය.

43. ගෝලීයකරණ ක්‍රියාවලියේ පූර්ව කොන්දේසියක් වන්නේ
(1) තාක්ෂණික ප්‍රගතිය ප්‍රතික්ෂේප කිරීමයි.
(2) කුටුම්බ හා ජාතික වටිනාකම්වලට ප්‍රමුඛත්වය දීමයි.
(3) වාර්ගික සංවෘතභාවයයි.
(4) පාරජාතික ආයතන නිර්මාණය වීමයි.
(5) ජනමාධ්‍යයන්ගේ ප්‍රසාරණයයි.

44. මාධ්‍ය විචාරයේ දී වඩාත් අවධානය යොමු විය යුතු කරුණු කිහිපයක් පිළිබඳ ව දේශකයෙක් සිය කතාවේ දී පැහැදිලි කළේ ය. සාකච්ඡා වාරයේ දී සමහරුන් ඒ පිළිබඳව ඉදිරිපත් කළ අදහස් කිහිපයක් පහත දක්වේ.
A - දෘෂ්ටිමය පෝෂණයක් තිබීම
B - ආචාරධර්මී ගුණයක් පැවැතීම
C - අභිප්‍රේරණයක් පැවැතීම
D - විඥපතික කාර්යයක් තිබීම
E - විශ්‍රාන්තික ගුණයක් තිබීම
මේවායින් වඩාත් සුදුසු කරුණු ලෙස සැලකිය හැක්කේ
(1) A,B හා D ය.
(2) A,B හා E ය.
(3) A,C හා D ය.
(4) B,C හා E ය.
(5) C,D හා E ය.

[ හයවැනි පිටුව බලන්න.

45. වෙළෙඳ දැන්වීම් හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.

A - නූතන වෙළෙඳ දැන්වීම් බොහොමයක් අදාළ නිෂ්පාදිතය පිළිබඳ විෂය මූලික (objective) තොරතුරු ලබා දෙයි.

B - මාධ්‍ය පරිභෝජන පිරිවැය අඩු වීම කෙරෙහි බොහෝ විට වෙළෙඳ දැන්වීම් බලපායි.

C - භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ දී වඩාත් නැණවත් තීරණ ගැනීමට වෙළඳ දැන්වීම්, පාරිභෝගිකයාට උපකාරී වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) A පමණක් නිවැරදි ය.
(2) B පමණක් නිවැරදි ය.
(3) C පමණක් නිවැරදි ය.
(4) A හා B පමණක් නිවැරදි ය.
(5) A,B හා C යන සියල්ල ම නිවැරදි ය.

46. මාධ්‍ය විචාර ප්‍රවේශ කිහිපයක් පහත දක්වේ.

A - දේශපාලන ප්‍රවේශය
B - සංසන්දනාත්මක හා විශ්ලේෂණ ප්‍රවේශය
C - භාෂාත්මක ප්‍රවේශය
D - සදාචාරාත්මක ප්‍රවේශය
E - ඓතිහාසික ප්‍රවේශය

එක්තරා පුවත්පත් ආයතනයක් පළ කරන දිනපතා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල එකම දේශපාලන ප්‍රවෘත්තියක් පළ වී තිබුණේ එකිනෙකට වෙනස් ආකාරයෙනි. මෙවැනි තත්ත්වයක් විමසා බැලීමට වඩාත් ම ගැළපෙන විචාර ප්‍රවේශ වන්නේ

(1) A,B හා C ය.
(2) A,B හා D ය.
(3) A,C හා D ය.
(4) B,C හා E ය.
(5) C,D හා E ය.

47. සමාජානුයෝජන ක්‍රියාවලිය හඳුනා ගැනීම හා සම්බන්ධ සංකල්ප කිහිපයක් පහත දක්වේ.

A - අනුකරණය
D - භූමිකා නිරූපණය
B - තදාත්මීකරණය
E - විසදෘශතාව
C - සංඝටනය

ඉහත සංකල්ප අතුරෙන්, සමාජානුයෝජන ක්‍රියාවලිය හඳුනා ගැනීම සඳහා අදාළ කර ගත හැකි සංකල්ප ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A,B,C
(2) A,B,D
(3) B,C,D
(4) C,D,E
(5) A,B,C,D,E

48. ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ සංවාදයක දී ඉදිරිපත් වූ කරුණු කිහිපයක් පහත දක්වේ.

A - සෑම සමාජ පන්තියක් ම ආකර්ෂණය කර ගනී.

B - මහා පරිමාණ ලෙස නිෂ්පාදනයක් හා බෙදාහැරීමක් පවතී.

C - කලාත්මක අංශයෙන් ඉහළ තැනක් ගනී.

D - වාණිජත්වය සමග බැඳී පවතී.

E - ශ්‍රමිකයන් තුළ ඉක්මනින් ප්‍රචලිත වේ.

ජනප්‍රිය සංස්කෘතිය සමග වඩාත් ගැළපෙන්නේ

(1) A,B,C හා D ය.
(2) A,B,C හා E ය.
(3) A,B,D හා E ය.
(4) B,C,D හා E ය.
(5) A,B,C,D හා E යන සියල්ල ම ය.

49. මාධ්‍ය දැන්වීම්කරණය යනු

A - සමාජයීය අවශ්‍යතාවක් ඉටු කිරීමකි.
D - ජනතාවගේ මතවාද වෙනස් කිරීමකි.
B - ව්‍යාපාරික අවශ්‍යතා ඉටු කිරීමකි.
E - යහපත් ආකාරයේ පෙලඹවීමකි.
C - සමාජයීය චර්යා වෙනස් කිරීමකි.

ඉහත අදහස් හා සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) A,B,C හා D සත්‍ය වන අතර E අසත්‍ය වේ.
(2) A,B,C හා E සත්‍ය වන අතර D අසත්‍ය වේ.
(3) A,B,D හා E සත්‍ය වන අතර C අසත්‍ය වේ.
(4) A,C,D හා E සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(5) B, C,D හා E සත්‍ය වන අතර A අසත්‍ය වේ.

50. තොරතුරු විසරණය සඳහා යොදා ගත හැකි විධික්‍රම කිහිපයක් පහත සඳහන් වේ.

A - ස්ථාවර දුරකථන සේවාව
B - ජංගම දුරකථන සේවාව
C - සාමාන්‍ය තැපැල් සේවාව
D - විද්‍යුත් තැපැල් සේවාව
E - කෙටි පණිවිඩ සේවාව

මේවා අතුරෙන් පුද්ගලාන්තර සන්නිවේදන නාලිකා ලෙස යොදා ගත හැක්කේ

(1) A හා B පමණි.
(2) A,B හා D පමණි.
(3) A,B,D හා E පමණි.
(4) A,B,C හා D පමණි.
(5) A,B,C,D හා E යන සියල්ල ම ය.

***

The National e-learning Portal for The General Education

AL/2010/29-S-II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**29 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II**
**தொடர்பாடல் ஊடகக்கற்கை II**
**Communication and Media Studies II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අයදුම්කරුවන්ට උපදෙස් :**

✻ ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව **20**කි.

1. ජනසන්නිවේදන මාධ්‍ය මගින් තොරතුරු ඉදිරිපත් කිරීමේ දී ප්‍රධාන වශයෙන් යොදා ගනු ලබන්නේ භාවිත භාෂාවයි. එහෙත් ඒ ඒ ජනමාධ්‍යයන්ට ආවේණික විශේෂතා පවතී. එම විශේෂතා අවබෝධකර ගැනීම, මාධ්‍ය පරිහරණයේ දී වැදගත් වේ.
   (i) ජනසන්නිවේදනය සතු ප්‍රධාන ලක්ෂණ **හතරක්** නම් කරන්න.
   (ii) වාචික සන්නිවේදනය යනු කුමක් ද'යි කෙටියෙන් පැහැදිලි කරන්න.
   (iii) ගුවන් විදුලි මාධ්‍යයේ දී භාෂාව යොදා ගනු ලබන ආකාර දෙකක් පහත දක්වේ. ඒවා **විස්තර** කරන්න.
   (අ) භාෂණය (ආ) රූපණය
   (iv) පුවත්පත් වාර්තා සඳහා භාෂාව භාවිත කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **පහක්** දක්වා, ඒවායේ වැදගත්කම පැහැදිලි කරන්න.

2. (i) ජනප්‍රිය සංස්කෘතියේ මූලික ලක්ෂණ **හතරක්** නම් කරන්න.
   (ii) දැන්වීම් ප්‍රචාරණයෙන් සමාජයට ලැබෙන ප්‍රයෝජන **හතරක්** කෙටියෙන් පහදන්න.
   (iii) රූපවාහිනී මාධ්‍ය සඳහා භාෂාව යොදා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු මූලික ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න.
   (iv) තොරතුරු සම්පාදන කාර්යයෙහි වැදගත්කම පිළිබඳ කරුණු **හතරක්** පදනම් කර ගනිමින් සඟරාවකට ලිපියක් සකස් කරන්න.

3. (i) 'මාධ්‍ය හා සංස්කෘතිය' අතර සම්බන්ධතාව කෙටියෙන් හඳුන්වන්න.
   (ii) ජනමාධ්‍ය මගින් සිදුවන අයහපත් බලපෑම අවම කර ගැනීමට භාවිත කරන ප්‍රධාන ක්‍රම **දෙකක්** උදාහරණ දක්වමින් විස්තර කරන්න.
   (iii) සමූහ සන්නිවේදන ක්‍රියාවලියක් සාර්ථක වීමට බලපාන නිපුණතා **හතරක්** නම් කර, ඉන් **දෙකක්** උදාහරණ සහිත ව විස්තර කරන්න.

4. වටිනා උපකරණ සහිත ව විනාශ වෙමින් පැවැති රජයේ ගොඩනැගිල්ලක් සිය ජංගම දුරකථනයෙන් රූගත කළ අනිල් එය ජනමාධ්‍ය ආයතනයක් වෙත ලබා දුන්නේ ය. එය එදින ප්‍රවෘත්ති විකාශයේ ප්‍රධාන ප්‍රවෘත්තියක් බවට පත් විය.
   (i) අනිල්ගේ මෙම වාර්තාකරණය නම් කළ හැක්කේ කවර මාධ්‍ය ප්‍රවණතාවක් ලෙස ද?
   (ii) එම වාර්තාකරණයේ මූලික ලක්ෂණ **තුනක්** දක්වන්න.
   (iii) විකල්ප ජනමාධ්‍යයක ලක්ෂණ **හතරක්** නම් කර, ඉන් **එකක්** පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
   (iv) නව මාධ්‍යයක් ලෙස අන්තර්ජාලය නූතන මාධ්‍යයන්ගෙන් වෙනස් වන ආකාර **හතරක්** පැහැදිලි කරන්න.

[ දෙවැනි පිටුව බලන්න.

5. ABC බැංකුවේ අරමුදල් මගින් පාසලක පරිගණක මධ්‍යස්ථානයක් සකස් කර, එය 'ABC පරිගණක මධ්‍යස්ථානය' නමින් විවෘත කිරීමේ උත්සවය පසුගියදා පැවැත්වුණි. ඒ පිළිබඳ ව පුවත්පත්වල පිටුවක දැන්වීම් අතිරේකයක් පළ කිරීමට බැංකුව කටයුතු කර තිබුණි.

   (i) පුවත්පත් දැන්වීමක් වෙනුවට පිටුවක දැන්වීම් අතිරේකයක් පළ කිරීමට ABC බැංකුව තීරණය කිරීම මහජන සම්බන්ධතා ක්‍රියාවලියේ මූලික ලක්ෂණයකි. මහජන සම්බන්ධතා ක්‍රියාවලියේ වැදගත්කම හා සම්බන්ධ කරුණු **හතරක්** නම් කරන්න.

   (ii) විවෘත කිරීම පිළිබඳ දර්ශන සහිත ප්‍රවෘත්තිය ප්‍රාදේශීය රූපවාහිනී වාර්තාකරුවකු තම නාලිකාවට යැවූ පසු එය විකාශය වූයේ පරිගණක මධ්‍යස්ථානයේ නාමය සඳහන් කිරීමකින් හෝ ප්‍රදර්ශනය කිරීමකින් හෝ තොරව ය. ඊට බලපෑ හැකි කරුණු **දෙකක්** පැහැදිලි කරන්න.

   (iii) එක් පුවත්පතක එම ප්‍රවෘත්තිය පළ වූයේ 'සංවර්ධනය' ට අදාළ විශේෂාංග පිටුවෙහි ය. තෝරාගත් එක් බටහිර මතවාදයක් ඇසුරෙන් සංවර්ධනය හා ජනමාධ්‍ය අතර පවත්නා සබඳතාව මූලික කරුණු **හතරක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න.

6. ''කමල්, ඔයාලත් එක්ක හෙට කතරගම යන්න මට එන්න වෙන්නෙ නෑ. ගමන යන්න සූදානම් වෙලා ඉන්න අනික් යාළුවො දහ දෙනාට ම කියල බැරිද ගමන ලබන සතියට කල් දගන්න.''

   උදෙන් ම ලැබුණු දුරකථන පණිවිඩය සුරේෂ්ගෙනි.

   ''ඇයි එන්න බැරි'' මම ඇසුවෙමි.

   ''මට හදිසියේ නුවර යන්න වෙලා තියෙනවා කමල්''

   (i) ඉහත සංවාදයේ දී භාවිත කළ **නොහැකි** අවාචික සන්නිවේදන විධික්‍රම **හතරක්** නම් කරන්න.

   (ii) පහත දැක්වෙන සන්නිවේදන ආකෘතිය කුමක් දැ'යි නම් කර, එහි ඉංග්‍රීසි අක්ෂරවලින් දැක්වෙන අංගවලට අනුරූප අංග කවරේ දැ'යි ඉහත සංවාදය ඇසුරෙන් දක්වන්න.

   S ⟶ M ⟶ C ⟶ R

   (iii) අන්තර් පුද්ගල සන්නිවේදනය යනු කුමක් දැ'යි එම ප්‍රභේදයට විශේෂිත කරුණු **තුනක්** ඇසුරෙන් කෙටියෙන් පහදන්න.

   (iv) ඉහත සංවාදයේ දී සුරේෂ් කමල්ගෙන් ඉල්ලා සිටින්නේ එක එල්ලේ ම ඉටු කිරීමට අපහසු ඉල්ලීමකි. මෙවැනි අවස්ථාවකට මුහුණ දීමට ඔබට සිදුවී ඇතැයි සිතන්න. එහි දී ඔබ අනුගමනය කරන ඵලදායි කථනය හා සම්බන්ධ උපාය මාර්ග **හතරක්** දක්වා, ඒවා වෙන වෙන ම සාකච්ඡා කරන්න.

7. ගෘහස්ථ සාමය බිඳවැටීමට අදාළ තොරතුරු ශ්‍රී ලංකාවේ දිනපතා පුවත්පත්වල බහුලව වාර්තා වේ. මෙබඳු තත්ත්වයක් ඇතිවීමට විවිධ හේතු සාධක බලපෑ හැකි ය.

   (i) ගෘහස්ථ සාමය බිඳවැටීමට හේතුවන කරුණු **හතරක්** නම් කරන්න.

   (ii) ප්‍රචණ්ඩත්වය පුවත්පත් මාධ්‍යය තුළ නිරූපණය වන ආකාර **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

   (iii) විචාරශීලී ග්‍රාහකයකු ලෙස ඔබ රූපවාහිනී මාධ්‍යය තුළ දකින, ප්‍රචණ්ඩත්වයට හේතුවන ප්‍රධාන සාධක **හතරක්** නම් කර, ඒවා නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

* * *

The National e-learning Portal for The General Education